22/02/2011

# ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
## ගෘහ ජල සම්බන්ධනයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය

(සහාධිපත්‍ය නිවාස සඳහා මෙම අයදුම්පත අදාළ නොවේ)

---

**ඉතා වැදගත් :-ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව සම්පූර්ණයෙන් කියවන්න.**

1 (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම ඃ

------------------------------------------------------------------------------------------------------------------------පූජ්‍ය/මයා/මිය/මෙනවිය.

(ii) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පුරවන්න) :

Rev/Mr./Mrs./Miss
(අදාළ වචන ඉතිරි කර අනවශ්‍ය කපා හරින්න)

(iii) ජාතික හැඳුනුම්පත් අංකය/රියදුරු බලපත්‍ර අංකය/විදේශ ගමන් බල පත්‍ර අංකය ඃ

2 ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානයේ ලිපිනය ඃ

i) සිංහලෙන්

නිවාස අංකය ----------------------------------------------
අතුරු පාර ----------------------------------------------
ග්‍රාමය/ප්‍රධාන පාර ----------------------------------------
නගරය ----------------------------------------------

ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින්

iii) ග්‍රාම නිළධාරී කොට්ඨාශය හා අංකය ඃ

iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

v) දිස්ත්‍රික්කය

3 ලිපි යැවිය යුතු ලිපිනය ඃ --------------------------------------------------------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------------------------------------------------

දුරකථන අංකය ඃ නිවස ඃ ---------------------- ජංගම ඃ ------------------------- ඊ මේල් ඃ ------------------------------------------

4 (a) අයදුම්කරු එම ස්ථානයේ අයිතිකරු/බදුකරු/කුලීකරු ද යන වග ඃ --------------------
(අයිතිකරු නොවේ නම් උපදෙස් බලන්න.)

5 වරිපනම් සහතිකය හෝ ග්‍රාම නිළධාරී පදිංචි සහතිකය හෝ ඉඩමේ ඔප්පුව ඉදිරිපත් කරමි. (අදාල වචන ඉතිරි කර අනවශ්‍ය වචන කපා හරින්න)

6 i) පාරිභෝගික කටයුතු සඳහා නම් කරනු ලබන බැංකුව ඃ ------------------------------------- ii) ගිණුම් අංකය ඃ ----------------------------------
**(කෙටි පණිවුඩ (sms) මගින් ගෙවීම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන් සඳහා පමණි)**

7 i) අයදුම්කරු සමෘද්ධි ලාභියෙකු නම් සමෘද්ධි කළමණාකරු සහතික කල කාඩ්පත් අංකය ඃ--------------------- ii) වලංගු කාල සීමාව / කල් පිරෙන දිනය ඃ --------------

8 i) මෙම ස්ථානයට මීට පෙර ජල සම්බන්ධනයක් ලබා ගෙන තිබේද? ii) තිබේ නම් ගිණුම් අංකය iii) වර්ගය /ප්‍රභේදය

9 ඔබ ජල සැපයුම ඉල්ලුම් කරන ස්ථානය යම් ප්‍රජා මූල සංවිධානයකින් කරන ජල යෝජනා ක්‍රමයකින් ආවරණය වන්නේද? ඔව් / නැත. ("ඔව්" නම් උපදෙස් පත්‍රිකා නැවත බලන්න).

10 ජල නල එලීම සඳහා කානු කපා දීම (ජල මණුව දක්වා) අයදුම්කරු සිදුකරන්නේද? ඔව් / නැත. ("නැත" නම් උපදෙස් බලන්න).

✂---------------------------------------------------------------------------------------------------------------------------------------------------

**අයදුම්පත භාරගත් බවට සනාථ කර පාරිභෝගිකයාට නිකුත් කරන ලදුපත**

ඔබගේ ජල සම්බන්ධන ඉල්ලුම් පත්‍රයේ ලියාපදිංචි අංකය ............................................. වේ. මෙම අයදුම්පත්‍රය භාර ගැනීම ඔබ වෙත ජල සම්බන්ධනයක් ලබා දීමට ස්ථිර සහතියක් නොවන බව කරුණාවෙන් සළකන්න. ඔබගේ ජල සම්බන්ධන පිළිබඳ විස්තර විමසීමේදී ලියාපදිංචි අංකය සඳහන් කරන්න.

ඉල්ලුම්කරුගේ නම ........................................................................ ඉල්ලුම්පත්‍රය භාරගත් දිනය ......................................

.........................................................
ස්ථානභාර නිළධාරී වෙනුවට (අත්සන හා නිළ මුද්‍රාව, ස්ථානය) **වැඩි විස්තර සඳහා ........................................ දුරකථනයට අමතන්න.**

11 ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානය පහසුවෙන් සොයා ගැනීම සඳහා අවශ්‍ය සම්පූර්ණ විස්තර සහිතව ස්ථානයට ලඟා විය හැකි මාර්ගය කටු සටහනකින් දක්වන්න.

යාබද නිවසේ ජල සම්බන්ධනයක් තිබේ නම් එහි ගිණුම් අංකය ඃ ..............................

මෙම අයදුම්පතෙහි දක්වා ඇති ස්ථානයට ජල සම්බන්ධනයක් ලබා ගැනිම සඳහා ඊට අනුකුල උපදෙස් මාලාව කියවා හොඳින් තේරුම්ගත් අතර අයදුම්පතෙහි සඳහන් කල සියලුම කරුණු සත්‍ය තොරතුරු බවට සහතික කරමි.

දිනය ඃ -------------------------

--------------------------------
අයදුම්කරුගේ අත්සන

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | නිකුත් කළ දිනය ඃ | | 2 | නිකුත් කළ ස්ථානය ඃ | |
| 3 | ලියාපදිංචි අංකය | | | | |

**ලබාදුන් ජල සම්බන්ධනයේ විස්තර**

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | ගිණුම් අංකය | | 8 | ජල සැපයුමෙහි ප්‍රමාණය | |
| 5 | ප්‍රභේදය | | 9 | මීටරයේ ප්‍රමාණය | |
| 6 | මීටරයේ වර්ගය (Meter Type) | | 10 | චක්‍රය (cycle) | |
| 7 | මීටර අංකය | | 11 | ජල සැපයුම දුන් දිනය | |
| | | | 12 | ජල සැපයුම දුන් දිනයට මීටරයේ කියවීම | |

.....................................
ජල සම්බන්ධනය ලබා දුන් නිලධාරී / සේවක මහතාගේ අත්සන

සේවක අංකය ඃ..........................

22/02/2011

## ගෘහ ජල සම්බන්ධනයක් සඳහා අයදුම් පත්‍රය පිරවීම සහ ජලසම්බන්ධන ලබා ගැනීම පිණිස උපදෙස්

### A. අයදුම්පත්‍රය පිරවීමේදී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමු.

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම සිංහල භාෂාවෙන් පැහැදිලිව ලියන්න.
1. (ii) අයදුම්කරුගේ නම ඉංග්‍රීසි "කැපිටල් අකුරෙන්" පැහැදිලිව ලියන්න.
1. (iii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න. ජාතික හැඳුනුම්පත් අංකය නොමැති විට විදේශ ගමන් බලපත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ අංකය සඳහන් කරන්න.

2. ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ ලිපිනය, ග්‍රාම නිළධාරී කොට්ඨාශය හා අංකය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා දිස්ත්‍රික්කය සඳහන් කරන්න.
3. ලිපි යැවිය යුතු ස්ථානයේ ලිපිනය නිවැරදිව සඳහන් කරන්න. ජල සම්බන්ධනය අයදුම්කරන්නාගේ නිවසේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය, ඊ මේල් ලිපිනය (තිබේ නම් පමණක්) සඳහන් කරන්න.
4. අයදුම්කරු ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ නීත්‍යානුකූල අයිතිකරු නොවේ නම් අදාළ ග්‍රාම සේවක හෝ සාමදාන විනිශ්චයකරුවකු විසින් සහතික කරන ලද අයිතිකරුගේ කැමැත්ත සහිත ලිපිය ඉදිරිපත් කරන්න.
5. වරිපනම් සහතිකය ලබා ගත හැකි ප්‍රදේශ වල ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ වරිපනම් සහතිකය ඉදිරිපත් කළ යුතු වේ. අනෙකුත් ප්‍රදේශ වල පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිළධාරී සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිතව ඉදිරිපත් කල යුතුය. (අදාල වචන ඉතිරි කර අනවශ්‍ය වචන කපා හරින්න)
6. කෙටි පණිවුඩ (SMS) මගින් ගෙවීම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන් පමණක් මෙම විස්තර පුරවන්න.
7. අයදුම්කරු සමෘද්ධි ලාභියෙකු නම් සමෘද්ධි කළමණාකරු සහතික කල සමෘද්ධි කාඩ්පත් අංකය සහ වලංගු දිනය සඳහන් කරන්න. (අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ සමෘද්ධි ලාභියෙකු බව සහතික කිරීමට අදාළ වර්ෂයේ ලිපිලේඛණ ඉදිරිපත් කළ යුතුයි.)
8. මෙම ස්ථානයට මීට ඉහතදී ජල සැපයුම ලබාගෙන ඇත්නම් එම විස්තර අනිවාර්යෙන්ම ඉදිරිපත් කල යුතුය.
9. ජල සම්බන්ධනය ඉල්ලුම් කරන්නේ ප්‍රජා මූල සංවිධාන හා බද්ධවී ක්‍රියාත්මක වන ජල යෝජනා ක්‍රමයකින් නම් ඒ බව සඳහන් කර ප්‍රජා මූල සංවිධානයෙන් එකඟතාවය ලබාගත් ලිපිය ඉදිරිපත් කළ යුතුය.
10. ජල නල එලීම සඳහා කානු කපා දීම (ජල මණුව දක්වා) අයදුම්කරු සිදුකරන්නේද? එසේ නම් "ඔව්" යනුවෙන් සඳහන් කරන්න. "නැත" යනුවෙන් සඳහන් කළ විට එය මණ්ඩලය විසින් සිදු කරන අතර ඊට අදාළ මුදල ඇස්තමේන්තුවට ඇතුළත් කරනු ඇත.
11. ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානය සොයා ගැනීම සඳහා පැහැදිලි රූප සටහනක් අඳින්න. අවශ්‍ය නම් වෙනම රූප සටහනක් අමුණන්න. යා බද නිවසේ ජල සැපයුමක් තිබේ නම් එහි ගිණුම් අංකය සඳහන් කිරීම ඔබගේ ස්ථානය හඳුනා ගැනීමට පහසුවක් වනු ඇත.

***ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර ජල සම්පාදන මණ්ඩලය වෙත භාරදී ලදුපත ලබාගැනීමට කටයුතු කරන්න.***

### B. ජල සම්බන්ධනය ලබා ගැනීමේදී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමු.

1. ඔබගේ අයදුම්පත්‍රය අනුව මණ්ඩලය විසින් ඇස්තමේන්තුවක් සහිත ගෙවීම්පත, ජල සම්බන්ධන ලබාදීමේදී සිදුවන මාර්ගය පළුදු කිරීම සම්බන්ධ විස්තර ඇතුලත් පත්‍රිකාව, ජල සම්බන්ධනය ලබාගැනීමේදී මණ්ඩලය සමග එළඹිය යුතු ගිවිසුම් පත්‍රිකාව ඔබවෙත ලබාදෙනු ඇත.
    - ජල සම්බන්ධනය ලබා ගැනීම සඳහා මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල අදාළ වවුචරයේ සඳහන් ස්ථානයට ගෙවිය යුතුය.
    - මාර්ගය පළුදු කිරීම සම්බන්ධ විස්තර ඇතුළත් පත්‍රිකාව අදාළ මාර්ගය නඩත්තු කරන ආයතනය වෙත ඉදිරිපත් කර මාර්ගයට සිදුවන හානි සඳහා ගෙවිය යුතු මුදල එම ආයතනය වෙත ගෙවිය යුතුය.

**ඉහත ගෙවීම් සිදුකර අදාළ ගෙවීම් පත්‍රිකාව සහ මාර්ගය පළුදුකිරීම සඳහා අදාළ මාර්ගය නඩත්තු කරන ආයතනය ලබාදුන් අවසර පත්‍රිකාව මණ්ඩලයේ අදාළ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.**

2. ජල සම්බන්ධනය ලබාගැනීමේදී මණ්ඩලය සමග එළඹිය යුතු ගිවිසුම අත්සන් කිරීම සඳහා අදාල ජල පාරිභෝගිකයා නොපැමිණෙන්නේ නම්, සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කර හා සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට අත්සන් කර මණ්ඩලයේ අදාළ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.
3. ජල සම්බන්ධන ලබා ගැනීමේදී ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවිය යුතුය. (මෙම මුදල අයදුම්කරුට ජල සැපයුම අවශ්‍ය නොවන අවස්ථාවක ජල සැපයුම ප්‍රධාන නලයෙන් විසන්ධි කර ගිණුම අවලංගු කර ආපසු ලබා ගත හැක).
4. ජල සම්බන්ධන ලබා දෙනුයේ පිවිසුම් මාර්ගය ඔස්සේය. **වෙනත් ඉඩමක් හරහා ලබා නොදේ.**
5. සාමාන්‍යයෙන් ගෘහ ජල සම්බන්ධන ලබා දෙනුයේ අඟල් ½ විශ්කම්භයෙන් යුතු නල මගින් වන අතර අයදුම්කරුගේ ඉල්ලීම සහ තාක්ෂණික හැකියාව මත අඟල් ¾ විශ්කම්භයෙන් යුතු නල මගින් ජල සම්බන්ධන ලබාදීමට සලකා බැලිය හැක. ජල මනුව සවි කිරීම සඳහා අවශ්‍ය කරන කුළුණ ඔබ විසින් ඉදි කර ගත යුතුවේ. මේ සඳහා උපදෙස් අදාළ කාර්යාලය මගින් ලබා දෙනු ඇත.
6. යම් හෙයකින් ඔබ විසින් ඉල්ලුම් කරන ලද ජල සම්බන්ධනය තාක්ෂණික හේතුවක් මත හෝ වෙනයම් හේතුවක් මත ලබා දිය නොහැකිනම් ඒ බව අයදුම්පත ලැබී දින 14ක් ඇතුළත ඔබ වෙත දැනුම්දීමට කටයුතු කරනු ඇත.
7. කුලියට හෝ බද්දට පදිංචි වී සිටින්නන් හට ඇස්තමේන්තු මුදල වාරිකව ගෙවීමේ පහසුකම් හිමි නොවනු ඇත.
8. මේ සම්බන්ධව ඔබට අමතර ගැටළුවක් වේ නම් ලදුපතෙහි සඳහන් දුරකථන අංකයට අමතා වැඩි විස්තර දැන ගැනීමට කාරුණික වන්න.
9. ගිවිසුම අත්සන් කිරීමේදී ගෘහ පාරිභෝගිකයන් විසින් ගිවිසුම්පතේ A හා C කොටස පමණක් නිසි පරිදි පුරවා අත්සන් කළ යුතුය.